**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර IV- 2018**

------------------------------------------------------------------------

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියෙහි - අදියර IV ට අදාල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ කාලය

------------------------------------------------------------------------

එවකට මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය හා වර්තමානයේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවනු ලබන නියෝජිත ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු නියෝජිත ආයතනය වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ 2007-2017 ප්‍රධාන මාර්ග සැලැස්මට අනුව මාර්ග ජාලය සංවර්ධනය කර මහජනතාවට නව ආර්ථික මංමාවත් නිර්මාණය කිරීම වන අතර ඒ සඳහා මධ්‍යම අධිවේගී මාර්ගයේ අදියර IV යටතේ වන අධිවේගී මාර්ග කොටස කුරුණෑගල සිට දඹුල්ල දක්වා කිලෝමීටර් 58.7 ක් ඇස්තමේන්තුගත පිරිවැය රු.බිලියන 161.6 කින් ඉදිකිරීමට අපේක්ෂිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් මාරු කළ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ වත්කම්වල වටිනාකම නිෂ්චය කර ගිණුම්වලට ගෙන ඒමට කටයුතු කර නොතිබුණි. | වත්කම් හා බැරකම් අඩුවෙන් දැක්වේ. | වත්කම් භාවිතා කිරිම වෙනුවෙන් කුලියක් අයකිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ ඉහළ කළමනාකරණය තීරණය කිරීමට එකඟවී ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය සඳහා මේ දක්වා කිසිඳු ප්‍රතිචාරයක් ලැබී නොමැති අතර 2019 මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලැබේ. | ව්‍යාපෘතියේ සත්‍ය පිරිවැය ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමස්ත මධ්‍යම අධිවේගී මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනය වෙනුවෙන් දරන ලද පිරිවැය එකතුව රු. මිලියන 2,193 න් ව්‍යාපෘතියට අදාල කොටස වෙන්කර ව්‍යාපෘතියේ අදියර IV ගිණුම්වලට ගෙන නොතිබුණි. | වත්කම් හා බැරකම් අඩුවෙන් දැක්වේ. | යථා කාලයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද තථ්‍ය වියදම ගිණුම්ගත කළ යුතු වේ. |

## 2.2. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ | ව්‍යාපෘතියට අයත් වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබූ අතර එහි වාර්තා ද | වත්කම් අවභාවිතා කිරීම. | එකඟ වේ. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මුදල් රෙගුලාසි | විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. | | | |
| (ආ) | 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී ආධාර කරුවෙකුගෙන් අරමුදල් ලබාගැනීම සඳහා ගිවිසුමක් හෝ අවම වශයෙන් සහතිකයක් හෝ නැතිනම් සහතික වීමක් තිබිය යුතු වුවද, ව්‍යාපෘතිය විසින් එවැනි ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි. මේ හේතුවෙන් වර්ෂ 03 කට ආසන්න කාලයක් ආධාර කරුවෙකු නොමැතිව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පැවතුණි. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය නඩත්තු කිරීම සඳහා අනවශ්‍ය වැය බරක් දැරීමට සිදු වේ. | මූලික වශයෙන් China Gezhouba Group International Engineering Co. Ltd. සමාගම හඳුනාගෙන තිබුණද නොවැලැක්විය හැකි හේතුන් මත 2016 වර්ෂයේදී කොන්ත්‍රාත්තුව ඉදිරියට ගෙන නොයන ලදී. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතු අතර අරමුදල් ලබාගැනීම සඳහා වැඩපිළිවෙලක් හඳුන්වා දිය යුතු වේ. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පිළිබඳව භෞතික ප්‍රගතිය**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ මධ්‍යම අධිවේගී මාර්ගය කුරුණෑගල සිට දඹුල්ල දක්වා කිලෝමීටර් 58.70 ක ඉදිකිරීම් කාර්යයෙන් සමන්විත වේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2016 වර්ෂයේ සිට ස්ථාපිතව ව්‍යාපෘතිය කළමනාකරණ ඒකකයේ මෙහෙයුම් වියදම් සඳහා රු.මිලියන 182.30 ක් 2018 දෙසැම්බර් 31 දින වන විට වැය වී තිබුණද, මධ්‍යම | සිවිල් වැඩ ආරම්භ කිරීමේ ප්‍රමාදය හේතුවෙන් පිරිවැය ඉහළ යෑමට හැකිය. | ව්‍යාපෘතියේ මූල්‍ය ක්‍රියාකාරකම් 2016 ජූලි 01 දින සිට ආරම්භ වී ඇති අතර මාසික සාමාන්‍යය පිරිවැය රු.මිලියන 6.11 (මාස 30 ක් සඳහා) කි. සිවිල් වැඩ ආරම්භ කිරීමට පෙර ඉඩම් මිලදී ගැනීමේ කාර්යයන් වෙනුවෙන් කාර්ය මණ්ඩලය අනුයුක්ත කළ යුතු වේ. | පිරිවැය ඉහළ යාම වළක්වා ගැනීම සඳහා මෙන්ම කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම වැළැක්වීම සඳහා කාල ඉලක්කයන් ළඟා කරගැනීමට විධිමත් අධීක්ෂණ ක්‍රියාපටිපාටියක් අනුගමනය කළ යුතු වේ. |

අධිවේගී මාර්ගයේ සිවිල් ඉදිකිරිමේ කටයුතු 2019 ඔක්තෝබර් 30 දින වන විටත් ආරම්භ වී නොතිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රේඛීය අමාත්‍යාංශයේ, මිනින්දෝරු දෙපාර්තමේන්තුවට සහ තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා එකතුව රු.මිලියන 3.5 ක දිරි දීමනා ගෙවා තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විට මාර්ග ඉදිකිරීමේ කාර්යය වෙනුවෙන් වූ ඉඩම් මිලදී ගැනීමේ ක්‍රියාවලියේ දුර්වල ප්‍රගතියක් පෙන්නුම් කෙරේ. | හිමිකම් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් වන්දි මුදල්වල පොලී පිරිවැය ඉහළ යාමට හැකිය. | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කළ අංක HAP-2/15/CORDI/15/1552 දරන චක්‍රලේඛය ප්‍රකාරව, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, තක්සේරු දෙපාර්තමේන්තුවේ සහ අමාත්‍යාංශයේ නිලධාරීන්ට ඉඩම් මිලදී ගැනීමේ කාර්යය කඩිනම් කිරීම සඳහා දිරි දීමනා ගෙවා තිබු මෙය ඉඩම් මිලදී ගැනීමේ පනත අනුව බෙදිය හැකිය. කෙසේ වෙතත්, දිරි දීමනා 2, 38(අ) සහ 5 වගන්තිවලට අදාළව පමණක් ගෙවා ඇත. | ඉඩම් මිලදී ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | දඹුල්ල ප්‍රදේශයේ පවතින බොහෝ ඉඩම් පන්සල්වලට, දේවාලවලට අයත් හෝ අනවසරයෙන් අල්ලාගත් ඒවා වේ. කෙසේ වෙතත්, 2014 මැයි 30 දිනැති අංක 1864/54 අති විශේෂ ගැසට් පත්‍රයට අමතර සහනයක් එම ඉඩම් හිමියන් විසින් ඉල්ලා ඇති අතර ඔවුන්ට වන්දි | හිමිකම් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් වන්දි මුදල්වල පොලී පිරිවැය ඉහළ යාමට හැකිය. | ගලේවෙල සහ දඹුල්ල ප්‍රදේශයේ සිටින බොහෝ ඉඩම් හිමියන් වන්දි සඳහා හිමිකම් ලබා ඇති අතර කැබිනට් පත්‍රය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ඉඩම් හිමියන්ගේ කටයුතු පිළිබඳව සාකච්ඡා කෙරෙමින් පවතින නිසා ගෙවීම් කිරීමේ කටයුතු අවසන්ව නොමැත. | ඉඩම් මිලදී ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

ගෙවනු ලබන ආකාරය 2019 සැප්තැම්බර් මාසය වන විටත් අවසානයක් වී නොතිබුණි.

## 3.3 පරිබාහිර ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සෘජු ලෙස සම්බන්ධ නොවූ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සංවර්ධන ක්‍රියාකාරකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 6.5 ක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි. | අරමුදල් අනිසි ලෙස භාවිතා විය හැකිය. | පොළොන්නරුව ව්‍යාපෘතියේ හදිසි අවශ්‍යතාවයක් හේතු කොටගෙන අරමුදල් උපයෝජනය කර තිබුණි. සියළුම මුදල් 2019 වර්ෂ අවසානයට පෙර අයකර ගනු ලැබේ. | ව්‍යාපෘතියට පරිබාහිරව සිදුකරන ක්‍රියාකාරකම් වෙනුවෙන් කරන ගෙවීම් ආපසු අයකර ගත යුතු වේ. |

## 3.4 විවාදාත්මක ස්වරූපයේ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|
| දේශීය අරමුදල් යොදා එ.ජ.ඩො. මිලියන 05 ක් ඉක්මවන ව්‍යාපෘතියක් දියත් කිරීමේදී ඒ සඳහා මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුමකට එළැඹ තිබිය යුතුය. කෙසේ වෙතත්, එවැනි ගිවිසුමක් අත්සන් කර නොතිබූ අතර එම නිසා විදේශ ව්‍යාපෘති අරමුදල් යටතේ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ ගෙවිය හැකිද යන්න ගැටළු සහගත විය. | ව්‍යාපෘතියේ මුළු පිරිවැය වැඩිවිය හැක. | මහා පරිමාණ ව්‍යාපෘති වෙනුවෙන් සහනශීලී අරමුදල් සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන ඇත. චීන එක්සිම් බැංකුව ණය ලබාදීමට එකඟ වී ඇත. | මූල්‍ය වැඩපිළිවෙලක් සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**3.5 මානව සම්පත් කළමනාකරණයට අදාළ නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ සේවක සංඛ්‍යාව ඉක්මවා කළමනාකරණ සහකාරවරුන් තිදෙනෙකු බඳවා ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේ රු.1,437,568 ක් ගෙවා තිබුණි. | අතිරික්ත කාර්ය මණ්ඩලය, ව්‍යාපෘතියට අමතර පිරිවැයක් ඇති කිරීමට හැකිය. | එකඟයි. කාර්යාල කළමනාකරුවෙකුට සහ පරිපාලන සහකාරවරුන් දෙදෙනෙකු සඳහා අනුමැතිය ලබා දී තිබුණද එම පුරප්පාඩු මේ දක්වා පුරවා නොතිබුණි. එම නිසා සියළුම පරිපාලන වැඩ කළමනාකරණ සහකරුවන් විසින් ආවරණය කරනු ලබයි. | අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත සීමාව ඇතුළත බඳවා ගත යුතු වේ. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් නියමිත අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත් පදනම මත උපදේශකවරුන් තිදෙනෙකු ව්‍යාපෘතිය සඳහා අනුයුක්ත කර රු.708,550 ක් ගෙවා තිබූ අතර එම උපදේශක දීමනා සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන යටතේ ගිණුම්ගත කර ඇත. | නුපුහුණු සේවක මැදිහත් වීම නිසා පාඩු සිදුවිය හැක. | ව්‍යාපෘතියේ IV කොටස සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ ඉහළ කළමනාකරණය විසින් උපදේශකවරුන් තිදෙනෙකු කාර්ය පැවරුම් පදනම මත අනුයුක්ත කර ඇත. එම තිදෙනාගෙන් දෙදෙනෙකු සේවයට වාර්තා කර 2018 මැයි හා ජුනි මාස වන විට සේවය අවසන් කර ඇති අතර ඉතිරි තනතුර උපදේශක (තාක්ෂණික සේවය) විය. | අදාළ අනුමැතීන් ලබාගත යුතු වේ. |